අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/1/1/2/1

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2023.02.27

චක්‍රලේඛ අංකය : **09 / 2023**

**සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,**
**සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්,**
**සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්,**
**සියලුම කොට්ඨාස භාර නි.අ.අ./ ස.අ.අ. වරුන්,**
**සියලුම පරිවෙණාධිපති හිමිවරුන්,**
**සියලුම රජයේ පාසල්වල විදුහල්පතිවරුන්,**
**රජය අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත.**

## <u>සමස්ත ලංකා පාසල් නර්තන තරගය - 2023</u>

අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් වාර්ෂිකව පැවැත්වෙන උක්ත තරගයෙහි **2023** වර්ෂයට නියමිත තරග චක්‍රලේඛය ප්‍රකාරව, ඔබ පළාතේ/ කලාපයේ/ කොට්ඨාසයේ/ විදුහලේ අදාල ගුරුභවතුන් සහ ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් දැනුවත් කර මෙම තරගයට ඔවුන්ගේ නිර්මාණ ඉදිරිපත් කිරීමට අදාල කටයුතු සිදු කරන ලෙස දන්වමි.

- රජයේ පාසල් (පිරිවෙන්, විද්‍යායතන ද ඇතුළත්ව), රජයේ අනුමත පාසල් සහ අර්ධ රාජ්‍ය පාසල්, මෙන්ම පෞද්ගලික සහ ජාත්‍යන්තර පාසල් වලට ද මෙම තරගය සඳහා ඉදිරිපත් විය හැකි ය.

## <u>හැදින්වීම.</u>

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් **1970** වර්ෂයේ සිට මේ දක්වා දිවයිනේ සියලුම පාසල්වල නර්තන ගුරු භවතුන්ගේ හා විෂයය හදාරන සිසු දරුවන්ගේ කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහාත්, ඔවුන්ගේ ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය සඳහාත්, මෙම තරගය සංවිධානය කර පවත්වනු ලැබේ. මෙම තරගය මගින් එක් වසරකට සිසුන් **40,000** ක් පමණ තම ප්‍රතිභාව ප්‍රදර්ශනය කරන අතර, නර්තන ගුරුභවතුන් ද තම නිර්මාණ කුසලතා වර්ධනය කර ගැනීමට මනා පිටුවහලක් ද ලබා ගනී.

වසරින් වසරට නව ක්‍රමෝපායන් උපයෝගී කර ගනිමින් පවත්වනු ලබන මෙම තරගය නිසා පාසල්වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් අර්ථවත් වේ. විෂයය නිර්දේශය අර්ථවත්ව පවත්වාගෙන යාම සඳහා ඉමහත් මෙහෙවරක් කරනු ලබන මෙම තරගය ගුරුභවතුන්ගේ, සිසුන්ගේ සහයෝගය සහ සුහදතාවය සංවර්ධනය කරන තරගයක් බවට ද පත්වී ඇත.

ජය පරාජය සමසේ බෙදා ගැනීමේ උතුම් වූ මානවීය ගුණාංග සංවර්ධනය කරනු ලබන මෙම තරගය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ළමුන්ගේ ප්‍රායෝගික කුසලතා ප්‍රවර්ධනය කිරීමට ද හේතුවේ.


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

## 01.සහභාගීත්වය සහ තරග තෝරා ගැනීම.

පහත 1,2,3 වර්ග යටතේ සියලුම රජයේ පාසල්/ පිරිවෙන් විද්‍යායතන/ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට ඉදිරිපත් විය හැකි ය. තරග නිර්මාණය හා පුහුණු කරවීම් අදාල පාසලේ ගුරුභවතුන් විසින්ම සිදුකිරීමට වගබලාගත යුතු අතර, බාහිර සම්පත් දායකයන් යොදවා ගැනීම සිදු නොකළ යුතු ය. මේ සඳහා අවශ්‍යතාවය අනුව අදාල අධ්‍යාපන කලාපයේ/ පළාතේ ගුරු උපදේශකවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ සහාය ලබා ගත හැකි ය. නර්තන ගුරුභවතුන් සේවයෙහි යෙදී සිටින පාසල්, ස්වේච්ඡා ගුරුභවතුන් යොදා නොගත යුතු අතර, එසේ නොවන අවස්ථාවල දී වසර දෙකක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද ස්වේච්ඡා ගුරුභවතුන් යොදා ගත හැකි ය. (එම පාසලේ වසර දෙකක් සේවය කල බවට අදාල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර තිබිය යුතු ය). ස්ථිර නර්තන ගුරුභවතුන් සේවයෙහි යෙදී සිටින පාසල් මෙම තරගය සඳහා සිසුන් සහභාගී කරවීම අනිවාර්ය වේ. එසේ ඉදිරිපත් නොවන පාසල් පිළිබඳව විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතු ය.

**රටේ පවතින විවිධ තත්වයන් මත එක් එක් කාණ්ඩයේ තරග, අදියර කිහිපයක් යටතේ පැවැත්වීමට සිදුවිය හැකි අතර දින කිහිපයකදී වුව ද තරග පැවැත්වීමට සිදුවේ. මේ පිළිබඳව විදුහල්පතිවරුන් සහ ගුරුභවතුන් අවධානය යොමු කොට ඉදිරිපත්වන තරග අංග සැලසුම් කරගත යුතු ය.**

### 01.01. තරගය පිළිබඳ පොදු නීති රීති.

තරග තෝරා ගැනීමේ දී පහත උපදෙස් හොඳින් පිළිපැදිය යුතු ය.

01.01.01. ශිෂ්‍ය සංඛ්‍යාව හා නර්තන අංගවල ස්වභාවය අනුව ඔබට නියමිත පාසල් වර්ගය තෝරා ගැනීම.

**01. ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් (1001 ඇතුලත්ව)**
**02. ශිෂ්‍ය සංඛ්‍යාව 301 - 1000 අතර පාසල් (301 සහ 1000 ඇතුලත්ව)**
**03. ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් (300 ඇතුලත්ව)**
04. **පෞද්ගලික පාසල් (අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි නොවන ලද) සහ ජාත්‍යන්තර පාසල්**
**05. විශේෂ තරග (භරත නාට්‍යම් සහ කථක් නර්තන)**

01.01.02. ඉදිරිපත් කළ හැකි තරග කාණ්ඩ පිළිබඳ අවබෝධය ලබා ගැනීම.
(A, B, C, D, E සහ විශේෂ වශයෙන් තරග කාණ්ඩ කෙරේ.)

| | |
|---|---|
| A - කාණ්ඩය | 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා තරග |
| B - කාණ්ඩය | 10, 11, 12, 13 ශ්‍රේණි සඳහා තරග |
| C - කාණ්ඩය | සිසුන් 300 ට අඩු පාසල් සඳහා තරග |
| D - කාණ්ඩය | විශේෂ තරග (සියලුම රජයේ පාසල්/ පිරිවෙන් විද්‍යායතන/ රජයේ අනුමත පෞද්ගලික පාසලවලට විවෘතව ඉදිරිපත් විය හැකි තරග |
| E - කාණ්ඩය | ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් සඳහා තරග |
| විශේෂ තරග | භරත නාට්‍යම් සහ කථක් නර්තන තරගය |

01.01.03. **සිසුන් 1000 ට වැඩි (1001 සිට) සහ සිසුන් 301 – 1000 ත් අතර පාසල් සඳහා තරග තෝරා ගැනීම.**

A - කාණ්ඩයෙන් ඕනෑම එක් සමූහ තරග අංගයක් හෝ ඒකල තරග අංගයක් වශයෙනි. (උපරිම වශයෙන් තරග ශීර්ෂ එකකි.)

B - කාණ්ඩයෙන් සමූහ තරගයක් හා ඒකල තරගයක් ලෙස හෝ සමූහ තරගයක් පමණක් ලෙස හෝ එක් ඒකල තරගයක් ලෙස හෝ වශයෙනි. (ඒ අනුව උපරිම වශයෙන් තරග ශීර්ෂ දෙකකි.)

D - කාණ්ඩයෙන් උපරිම වශයෙන් තරග අංග දෙකක් ද වශයෙනි.

01.01.04. **සිසුන් 300 ට අඩු පාසල් සඳහා තරග තෝරා ගැනීම.**

C - කාණ්ඩයේ තරග අංක වලින් ඕනෑම තරග අංක දෙකක් ද, (තරග අංක එකකට හෝ තරග අංක දෙකකට හෝ ඉදිරිපත් විය හැකි ය.)

D - කාණ්ඩයෙන් ඉදිරිපත් විය හැක්කේ තරග අංක එකකට පමණි.

- ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් සඳහා තරග තෝරා ගැනීමේ දී ඉහත C සහ D කාණ්ඩ වලට අමතරව ශිෂ්‍ය සංඛ්‍යාව 301 - 1000 ත් අතර පාසල් හෝ ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් යටතේ ඇති ඕනෑම තරග අංකයක් ද තෝරා ගත හැකි අතර නර්තනයේ දී, වාදනයේ දී සහ ගායනයේ දී එකී පාසල් වලට අදාලව ඇති කොන්දේසිම බලපැවැත්වේ. සහාය වාදනය සිසුන් විසින්ම ඉදිරිපත් කළ යුතු ය. එහි දී මිශ්‍ර අංග සඳහා නර්තනයේ දී ගැහැණු පිරිමි සංඛ්‍යාව සමාන විය යුතු ය. (01.03.01, 01.04.01 වලට අදාල කොන්දේසි) උපරිම වශයෙන් තරග අංග 04 තෝරා ගත හැකි ය.

01.01.05. ජාත්‍යන්තර/ පෞද්ගලික පාසලක් සඳහා නියමිත තරග E කාණ්ඩය යටතේ තරග අංක 01 කට පමණක් ඉදිරිපත් විය හැකි ය.

01.01.06. විශේෂ තරග (භරත නාට්‍යම් සහ කථක් නර්තන තරග) සඳහා පාසල් සිසුන් සංඛ්‍යාව අනුව **වෙන් වෙන් වශයෙන් නොව එකම තරගයක් ලෙස පැවැත්වේ.**

එක් පාසලකට ඉහත 01.01.03, 01.01.04, 01.01.05 සඳහන් සහභාගීත්ව වලට අමතරව මෙම තරගයේ ඕනෑම අංග 02 කට සහභාගී විය හැකි ය.

- අයදුම් පත්‍ර - 2023 මාර්තු 30 වන දිනට ප්‍රථම "2023 විශේෂ නර්තන තරගය" - යනුවෙන් සඳහන් කර, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (නර්තන), සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. යන ලිපිනයට තැපැල් කළ යුතු ය.

01.01.07. 2022 වර්ෂයේ දී සමස්ත ලංකා පාසල් නර්තන තරගයේ ඒකල තරග වල දී ප්‍රථම ස්ථානය ලැබූ තරගකරුවන්ට 2023 වර්ෂයේ දී එම සම්ප්‍රදාය සහ එම තරග ශීර්ෂයටම ඉදිරිපත් විය නොහැකි ය.

උදා - (උඩරට, පහතරට, සබරගමු, වාදන, නිර්මාණ, චරිත නිරූපණය සහ 2022 D කාණ්ඩයේ ඒකළ තරග සහ 2022 පවත්වන ලද භරත නාට්‍යම් සහ කථක් නර්තන ඒකල)

## 01.02. තරග අංක සඳහා සහභාගී විය හැකි ගුරු/ සිසු සංඛ්‍යාවන් පිළිබඳ උපදෙස්.

01.02.01. සියලුම ඒකල සහ යුගල නර්තන තරග අංක සඳහා නර්තනයට හැර සහාය වාදන සහ ගායනය සඳහා සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි.

01.02.02. සියලුම සමූහ නර්තන අංග සඳහා නර්තනයෙන් සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 16 ක් වන අතර එම අංගයේ සහාය ගායනට සහ වාදනයට සහභාගී විය හැකි සංඛ්‍යාව 08 කි. නර්තන අංගයේ සමස්ත සහභාගීත්වය උපරිමය 24 කි.

01.02.04. ඒකල සහ යුගල වාදන තරග අංක සඳහා සහාය විය හැක්කේ එක් තාලම්පට වාදකයෙකුට පමණි. හක්ගෙඩිය භාවිතා කරන්නේ නම් තාලම්පට වාදකයා විසින්ම එය සිදු කල යුතු ය.

01.02.05. සමූහ නර්තන අංග සඳහා සහාය ගායනය කරමින් තාලම්පට වාදනයේ යෙදෙන විට, එය ගායන සංඛ්‍යාවට අයත් වන අතර, තාලම්පට වාදනය පමණක් සිදුකරන විට වාදන සංඛ්‍යාවට අයත් වේ.

01.02.06. සිසුන් 300 ට අඩු පාසල් වලින් ඉදිරිපත්වන මිශ්‍ර තරග අංක සඳහා සිසු සිසුවියන් අවම වශයෙන් එක් වර්ගයකින් 03 දෙනෙකුවත් සිටීම අනිවාර්ය වේ.

01.02.07. සිසුන් 301-1000 සහ 1001 ට වැඩි පාසල් තරග අංක සඳහා සහභාගීවීමේ දී, මිශ්‍ර සමූහ නර්තන අංක සඳහා නර්තනයෙන් ගැහැණු - පිරිමි සමාන සංඛ්‍යාවන්ගෙන් යුතුව ඉදිරිපත් වීම අනිවාර්ය වේ.

## 01.03. වාදන සහාය.

01.03.01. ශිෂ්‍ය සංඛ්‍යාව 301-1000 සහ ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් වලින් ඉදිරිපත් වන සියලුම නර්තන තරග අංග සඳහා සහාය වාදනය සිසුන් විසින්ම ඉදිරිපත් කළ යුතු ය. පිරිමි නර්තන තරග අංග සඳහා සහාය වාදනයෙන් **පිරිමි ළමුන් පමණක් ද**, ගැහැණු නර්තන තරග අංග සඳහා සහාය වාදනයෙන් **ගැහැණු ළමුන් පමණක් ද**, ඉදිරිපත් විය යුතු ය. මිශ්‍ර නර්තන තරග අංග සඳහා බෙර වාදනයෙන් සහාය වීමේ දී පමණක් ශිෂ්‍ය ශිෂ්‍යාවන් දෙවර්ගයම මිශ්‍ර වශයෙන් සහභාගී විය යුතු ය. (අනෙකුත් පාසල් සඳහා මෙම කොන්දේසි අදාල නොවන අතර එම පාසල් ගුරුභවතුන්ට ද වාදනයෙන් සහාය විය හැකි ය.)

## 01.04. ගායන සහාය.

01.04.01. පිරිමි තරග අංග සඳහා ශිෂ්‍යයන් පමණක් ද, ගැහැණු තරග අංග සඳහා ශිෂ්‍යාවන් පමණක් ද, මිශ්‍ර තරග අංග සඳහා මිශ්‍ර වශයෙන් ද ගායනයට සහභාගී විය යුතු ය.

01.04.02. ගායනයෙන් සහභාගීවන සියලුම ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් ඒ ඒ තරග අංග වලට අදාල ශ්‍රේණි වල විය යුතු ය.

01.04.03. තරග අංග සඳහා ගුරුවරුන්ට ගායනයෙන් සහාය විය නොහැකි ය.

01.04.04. ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු ස්ථිර ගුරුවරයෙකු නොමැති පාසල් සම්බන්ධයෙන් තරගයට ඉදිරිපත් වන පාසලෙහි සේවයේ යෙදී සිටින සංවර්ධන නිලධාරීන් සහ සංවර්ධන සහකාරවරුන්ට එම පාසලට පමණක් සහාය වාදනයෙන් දායක වීමට මෙවර තරගයේදී අවස්ථාව හිමිවේ.

## 02. අදාල වෙනත් කරුණු

### 02.01. අයදුම්පත් යොමු කිරීම.

02.01.01. තරගය සඳහා ඉදිරිපත් වීමේ දී අදාල චක්‍රලේඛයේ අංක 02 ඇමුණුම අනුව සකස් කරන ලද අයදුම්පත් භාවිතා කළ යුතු ය. සහභාගීවන සෑම ශිෂ්‍යයෙක්ම විදුහල්පති ඉදිරියේ එක් තීරුවක අත්සන් කළ යුතු අතර, අනෙක් තීරුව තරග සංවිධාන මණ්ඩලය ඉදිරියේ අත්සන් කිරීමට ඉඩ තැබිය යුතු ය. විදුහල්පති විසින් සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක් ද, විදුහල්පති විසින් සහතික කරන ලද ඡායාරූපයක් හෝ වලංගු හැඳුනුම්පතක් ද ඉදිරිපත් කළ යුතු ය.

02.01.02. ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී යතුරු ලියනය නොකරන්නේ නම්, ඉතා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය වේ. අයදුම්පතෙහි පාසලේ නම සහ මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලිවිය යුතු ය. සෑම තරග අවස්ථාවක් සඳහාම අංග සම්පූර්ණ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු වේ. යම් පාසලක් තරග ශීර්ෂ කිහිපයකට ඉල්ලුම් කිරීමේ දී, එක් තරග ශීර්ෂයකට එක බැගින් වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය. නාමලේඛන සකස් කිරීමේ දී අදාළ ගුරුභවතාගේ නමට ඉදිරියෙන් මෙය/ මිය/ මයා වශයෙන් ද අනිවාර්යයෙන්ම සටහන් කළ යුතු ය.

02.01.03. **D කාණ්ඩය** යටතේ තරග අංක සඳහා ද භරත නාට්‍යම් සහ කථක් නර්තන අංක සඳහා ද ඉදිරිපත්වන පාසල් තම අයදුම්පත් **2023 මාර්තු මස 28 වන දිනට ප්‍රථම** අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"සමස්ත ලංකා පාසල් නර්තන තරගය - 2023"** යනුවෙන් ද, තරග ශීර්ෂ අංකය ද සඳහන් කළ යුතු වේ.

### 02.02. වෙනත් උපදෙස්.

02.02.01. යම් තරගකරුවෙකු කලාප තරගය සඳහා ඉදිරිපත් වී ජයග්‍රහණය කළ පසු වෙනත් පාසලකට ඇතුලත් වුවහොත් අදාල වර්ෂයේ පළාත් සහ සමස්ත ලංකා තරග සඳහා ඉදිරිපත් විය යුත්තේ කලාප තරග සඳහා නියෝජනය කළ පාසලෙන් පමණි.

02.02.02. අ.පො.ස. (සා.පෙළ) / (උ.පෙළ) විභාගයට දෙවන වරට පෙනී සිටින සිසුන්ට ද සහභාගි විය හැකි ය.

02.02.03. රංග භාණ්ඩ සංඛ්‍යාවන් පිළිබඳ සීමාවක් නොමැත.

02.02.04. සියලුම නර්තන අංක සඳහා වේදිකා පසුතල නිර්මාණ, පන්දම් ආදිය භාවිත නොකළ යුතු ය.

02.02.05. මෙම තරගය හා සම්බන්ධ කිසියම් සිසුවෙකුට, ගුරුභවතෙකුට, පාසලකට, නිලධාරියෙකුට, තරග විනිසුරුවෙකුට හෝ අධ්‍යාපන ආයතනයක ගරුත්වයට හා පෞරුෂයට හානි සිදුවන ආකාරයෙන් තරගය හා සම්බන්ධයෙන් පාර්ශවකරුවන් කටයුතු කර ඇති විටෙක (ප්‍රසිද්ධියට පත් කරමින් හෝ වෙනත් ආකාරයකින්) ඒ හා සම්බන්ධයෙන් පවතින නීති රීති අණපනත් අනුව කටයුතු කිරීම සිදු වේ.

02.02.06. ගුරු ආචාර ධර්ම, සිසුන්ගේ ආචාර ධර්ම පද්ධතියට හෝ නිලධාරින්ගේ වගකීම් වලට අනුකූල වන ලෙස සහභාගීවන්නන් ක්‍රියාකළ යුතු අතර විනය හා ආචාර ධර්ම ආදියට හානිදායක වන හෝ නොගැලපෙන අයුරින් කටයුතු කර ඇති විටෙක ඒ පිළිබඳව පැවැත්වෙන විධිමත් විනයානුකූල පරීක්ෂණ ආදියට ඉදිරිපත් වීමට වගකීමට බැඳේ.

02.02.07. **2023 වර්ෂයේ මැයි මාසය** වන විට සිසුන් අදාල ශ්‍රේණි වලම සිටිය යුතු ය.

## 02.03. <u>තරග අංක සඳහා කාලය.</u>

02.03.01. ඒකල සහ යුගල තරග සඳහා උපරිම කාලය විනාඩි 05 කි.

02.03.02. සමූහ තරග සඳහා උපරිම කාලය විනාඩි 06 කි.

02.03.03. අමතර සමා කාලය තත්පර 45 කි.

## 02.04. <u>තරගකරුවන්ගේ ඇඳුම් පැළඳුම්.</u>

02.04.01. කලාප, පළාත් සහ සමස්ත ලංකා අවසන් තරගය සඳහා පුහුණු ඇඳුම් කට්ටලයෙන් පමණක් ඉදිරිපත් විය යුතු ය. (චරිත නිරූපණ අංග හැර) පළාත් සහ සමස්ත ලංකා අවසන් තරගය සඳහා ශිෂ්‍යාවන්ගේ සාය සහ හැට්ටය තනි වර්ණයෙන් විය යුතු අතර, කළු පිජාමා කලිසම භාවිතා කළ යුතු ය. (ලියෝටාඩ් භාවිතා කරන්නේ නම් කළු වර්ණයෙන් විය යුතු ය.) පළාත් සහ සමස්ත ලංකා අවසන් තරගය සඳහා ශිෂ්‍යයින් සඳහා කළු පාට අත් රහිත බැනියම (ස්කිනියර්) සහ දණහිස දක්වා උසින් යුක්ත ඉනට අඳින කෙටි තනිපාට රෙද්ද සමඟ කළු පිජාමා කලිසම ද භාවිතා කළ යුතු ය.

02.04.02. ඇඳුම් අලංකරණය සඳහා රිබන්, රේන්ද, බොත්තම් ආදී අලංකරණ දැ භාවිත නොකළ යුතු ය.

02.04.03. නර්තනයේ දී මාල, විශේෂිත කරාබු, වළලු ආදී ආභරණ භාවිත කළ නොහැකි ය.

02.04.04. සහාය ගායනය / සහාය වාදනය සඳහා සහභාගීවන සිසුන් පුහුණු ඇඳුම් කට්ටලයෙන් හෝ සුදුසු පහසු ඇඳුමකින් සැරසීම ප්‍රමාණවත්ය. පාසලේ අනන්‍යතාවය ප්‍රදර්ශනය වන ආකාරයේ කිසිවක් භාවිතා නොකළ යුතු ය. (කලාප තරග සඳහා මෙය අදාල නොවේ.)

02.04.05. කලාප, පළාත් තරග අවස්ථාවන්හි දී ඇඳුම් සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් මතු වුවහොත් ඒ පිළිබඳව තීරණ ගැනීම, අදාල කලාප/ පළාත් නර්තන විෂයය භාර නි.අ.අ./ ස.අ.අ. වරුන්ගේ නිර්දේශ මත කලාප/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදුකළ යුතු ය.

## 03. කලාප/ පළාත් තරග සංවිධානය.

03.01. කලාප තරගයට අදාල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් සෞන්දර්ය/ අදාල විෂයය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ විෂයය ගුරු උපදේශකගේ සහාය ඇතිව තරගය සංවිධානය කළ යුතු වේ. කලාප තරගයේ සියලු වගකීම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරෙන අතර, ඔහු/ ඇය මෙම උපදෙස් සංග්‍රහය උල්ලංඝනය නොවන පරිදි කලාප තරග ප්‍රතිඵලවල අවසන් තීරක ද වේ.

- **කලාප තරග 2023 අප්‍රේල් 15 වන විට පවත්වා, පළාත් තරග සංවිධානය සඳහා අදාල ප්‍රතිඵල ලේඛන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.**

03.02. පළාත් තරගය අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් සංවිධානය කළ යුතු ය. මෙම කටයුතුවල දී පළාතේ අදාල විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට සහාය විය යුතු ය. අවශ්‍ය අවස්ථාවල දී පමණක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය) ගේ එකඟතාව සහිතව එම පළාතට අයත් සෞන්දර්ය විෂයය භාර නිලධාරියකු, සම්බන්ධීකරණ/ සංවිධායක නිලධාරියා වශයෙන් නම් කරනු ඇත. පළාත් තරගයේ සියලුම වගකීම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරෙන අතර මෙම උපදෙස් සංග්‍රහය උල්ලංඝනය නොවන පරිදි ඔහු/ ඇය පළාත් තරග ප්‍රතිඵල වල අවසන් තීරක ද වේ. යම් විෂයානුබද්ධ ගැටළු අවස්ථාවක පළාතේ අදාල විෂයය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාල තීරණ ගත යුතු ය.

- **පළාත් තරග 2023 මැයි 30 වන විට පවත්වා අවසාන තරග සංවිධානය සඳහා ප්‍රතිඵල ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ වෙත එවිය යුතු ය.**

03.03. කලාප මට්ටමට පෙනී සිට ජයග්‍රහණය කළ සිසු - සිසුවියන්ම පළාත් මට්ටමට ද, පළාත් මට්ටමට පෙනී සිට ජයග්‍රහණය කළ සිසු - සිසුවියන්ම ජාතික මට්ටමට ද පෙනී සිටීම අනිවාර්ය වේ. මේ සම්බන්ධයෙන් නොවැළැක්විය හැකි යම් ගැටලුවක් මතු වුවහොත්, පාසලේ විදුහල්පතිගේ නිර්දේශ මත කලාප තරග මට්ටමේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේත්, පළාත් තරග මට්ටමේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේත්, සමස්ත ලංකා තරග මට්ටමේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය) ගේ අනුමැතිය මත පමණක් එම ගැටලුව නිරාකරණය කර ගත යුතු ය.

03.04. යම් තරග ශීර්ෂයකින් කලාප තරගයකට ඉදිරිපත් නොවූ කිසිදු පාසලක් පළාත් තරග අවස්ථාවට සහභාගී නොකිරීමටත්, පළාත් තරග අවස්ථාවට සහභාගී නොවන පාසලක් අවසන් මහා තරගය සඳහා ඉදිරිපත් නොකිරීමටත්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා, පළාත් සෞන්දර්ය අධ්‍යක්ෂවරයා සහ සම්බන්ධීකරණ නිලධාරියා වග බලා ගත යුතු ය.

03.05. කලාප/ පළාත් තරගවල දී කුමන හේතුවක් නිසා හෝ සම ස්ථාන ලබා නොදිය යුතු ය. එක් තරග ශීර්ෂයකින් ජාතික මට්ටමට නිර්දේශ කළ යුත්තේ එක් පාසලක් පමණි. මෙහි පූර්ණ වගකීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සතු වේ. සමස්ත ලංකා තරගයට කැඳවනු ලබන්නේ පළාත් මට්ටමේ තරගයෙන් ප්‍රථම ස්ථානය දිනාගත් පාසල් පමණි. (මෙම කොන්දේසිවලට පරිබාහිර අවස්ථා වේ නම් ඒවා අදාල ශීර්ෂ යටතේ දක්වා ඇත.)

03.06. කලාප හෝ පළාත් තරග පැවැත්වීම පිළිබඳ අධීක්ෂණය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරියෙකුට හා කලාප තරග පැවැත්වීම පිළිබඳ අධීක්ෂණය සඳහා අදාල පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරන ලද නිලධාරියෙකු සහභාගී විය යුතු ය.

## 04. තරග විනිශ්චය.

04.01. කලාප තරග විනිශ්චය සඳහා විනිශ්චය මණ්ඩලය අදාල කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ද, පළාත් තරග විනිශ්චය කටයුතු සඳහා වන විනිශ්චය මණ්ඩලය අදාල පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ද, තම කලාප/ පළාත් සෞන්දර්ය හෝ නර්තන විෂයය භාර නිලධාරීන්ගේ නිර්දේශ මත පත් කළ යුතු ය. අවසන් තරගයේ විනිශ්චය සංයුතිය තීරණය කරනු ලබනුයේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ නර්තන විෂයය භාර අධ්‍යාපන අධ්‍යක්ෂගේ උපදේශකත්වයෙන් හා සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය මතය. එමෙන්ම යම් තරග ශීර්ෂයක විෂයානුබද්ධ ගැටළුවක් මතු වී ඇති විටෙක, ඒ පිළිබඳව යම් තීරණයක් ගත යුතු යැයි හැඟේනම් පමණක්, අධ්‍යාපන ලේකම්ගේ එකගතාව මත විනිශ්චය මණ්ඩලය සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීම සිදුවේ.

04.02. කලාප/ පළාත් තරග සඳහා සුදුසු විනිශ්චය මණ්ඩලයක් නිර්දේශ කිරීම අදාල කලාපයේ/ පළාතේ සෞන්දර්ය හෝ නර්තන විෂයය භාර ස.අ.අ./ නි.අ.අ.ගේ වගකීම වේ. විනිශ්චය ලබා දීමේ දී අපක්ෂපාතීව, වගකීම් සහිතව සහ පරිණතභාවයෙන් යුතුව එහි නිරත විය හැකි ප්‍රවීණයන් ඒ සඳහා නිර්දේශ කිරීමත්, තරග කොන්දේසි හා නීති ඇතුළු අදාල අනෙකුත් කාරණාවන් අරභයා විනිශ්චය මණ්ඩලය මැනවින් දැනුවත් කිරීමත් පිළිබඳව අදාල කලාපයේ/ පළාතේ/ සෞන්දර්ය නර්තන විෂයය භාර ස.අ.අ./ නි.අ.අ. වගකිව යුතු වේ.

04.03. අදාල තරග අවස්ථාවෙන් පසුව සියලුම විනිශ්චය සටහන් පත්‍රිකා අදාල කලාප/ පළාත් අධ්‍යක්ෂවරයාගේ අත්සන සහිතව සුරැකිව තබා ගැනීම කලාපයේ/ පළාතේ සෞන්දර්ය/ නර්තන විෂයය භාර ස.අ.අ./ නි.අ.අ. ගේ වගකීම වේ. තරගයෙන් පසුව ඊට සම්බන්ධ වූ යම් පාසලක් කලාප/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිරීක්ෂණයට ඉල්ලා සිටියහොත්, තරග ශීර්ෂයට අදාල එම සටහන් නිරීක්ෂණයට ඉඩ ලබා දිය යුතු ය.

04.04. තරගයේ දී කිසියම් ඒකල හෝ සමූහ තරග ශීර්ෂයකට තරග වදින කණ්ඩායම් සියල්ල හෝ කිහිපයක් හෝ එකක් හෝ අවශ්‍ය සාධන මට්ටම, එනම් ලකුණු 33 ක් වන අවම සාධන ලකුණු මට්ටම ඉක්මවා නැති බව විනිශ්චය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී එම කණ්ඩායමට හෝ කණ්ඩායම් වලට ජයග්‍රහණය ලබා නො දෙනු ඇත.

04.05. කලාප/ පළාත් හා ජාතික තරගය පවත්වන දිනයේ දීම අදාල තරග ශීර්ෂයන්හි ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ. යම් ආකාරයකින් මේ සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් පැන නැගී ඇති විටෙක, අදාල පරීක්ෂණ වලින් පසුව එම ප්‍රතිඵල නිකුත් කෙරේ. සමස්ත තරග මාලාවෙහි තරග අවස්ථාවන්හි දී විනිශ්චයන් හා සම්බන්ධව විනිශ්චය මණ්ඩලය සමඟ කරුණු සාකච්ඡා කිරීමට තරගකරුවන්ට හෝ ගුරුභවතුන්ට අවස්ථාවක් නොලැබෙන අතර, ඒ පිළිබඳ යම් අදහසක් වේ නම් ප්‍රධාන තරග සංවිධායක වෙත පමණක් ලිඛිතව කරුණු ඉදිරිපත් කළ යුතු ය.

04.06. තරගයේ කිසියම් අදියරක දී, ඊට සම්බන්ධ යම් පාර්ශවයක් යම්කිසි වංචනික ක්‍රියාවක නිරත වීම මගින් හෝ වෙනත් ආකාරයකින් තරග ප්‍රතිඵල වලට බලපෑමක් වන අයුරින් තරගයට ඉදිරිපත් වී ඇති බවට කවර හෝ අවස්ථාවක දී වුවද අනාවරණය වුවහොත් සහ එය පිළිගත හැකි සහ වගකීම් සහගත අනාවරණයක් නම් ඒ පිළිබඳව පරීක්ෂා කර අවශ්‍ය පියවර ගනු ලැබේ. එහිදී යම් තරග ශීර්ෂයක ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව වුවද, චෝදනාවේ බරපතලකම අනුව අදාල පාසල එම තරග ශීර්ෂයෙන් ඉවත් කරන්නේ නම් ඊළඟ ඉහළම ලකුණු මට්ටම ලබාගත් පාසලට ජයග්‍රහණ අවස්ථා පිළිවෙලින් හිමි වේ.

## 05. සහතික පත්‍ර ලබා දීම.

05.01. කලාප හා පළාත් මට්ටමේ තරග වලින් ජයග්‍රහණය ලබා ගන්නා සිසුන්ට සහතික පත්‍ර පිරිනැමීම කලාප හා පළාත් මට්ටමින් සිදු කළ යුතු වේ. ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සහතික පත්‍ර පිරිනමනු ලැබේ.

## 06. විනය සහ වගවීම - පිළිබඳ අදහස්.

06.01. එක් එක් තරග අවස්ථාවට සහභාගී වීමට තරග මධ්‍යස්ථානවලට සහ නේවාසික මධ්‍යස්ථානවලට පැමිණෙන සිසුන්ගේ විනය, හැසිරීම, ආරක්ෂාව හා භාරකාරත්වය පිළිබඳව විදුහල්පතිවරුන්ගේ සහ කණ්ඩායම් භාර ගුරු මහත්ම මහත්මීන්ගේ විශේෂ අවධානය යොමු විය යුතු ය.

06.02. ශිෂ්‍යාවන්ගේ භාරකාරත්වය ගුරු මහත්මීන්ට ද, ශිෂ්‍යයින්ගේ භාරකාරත්වය ගුරු මහත්වරුන්ට ද, පැවරිය යුතු ය. ශිෂ්‍යයින් හා ශිෂ්‍යාවන් යන දෙපිරිසම සහභාගී වන විට ගුරු මහත්ම මහත්මීන් යන දෙපාර්ශවයටම භාරකාරත්වය පැවරිය යුතු ය.

06.03. කිසියම් අයථා සිදුවීමක් සිදුවුවහොත් ඒ සඳහා භාරකරුවන් වගකීමට බැඳේ. තරගය හා සම්බන්ධ කිසිදු අවස්ථාවක් සඳහා දෙමාපියන් සහ වෙනත් සුබපතන්නන්/ පාර්ශවකරුවන් සහභාගි කර නොගත යුතු ය. (මේ පිළිබඳව විදුහල්පති වගකීමට බැඳේ.)

06.04. මෙම තරගයේ සෑම අවස්ථාවක දීම යම් විදුහලක් ආශ්‍රිතව මීට අදාල සෑම කටයුත්තක්ම සිදුවිය යුත්තේ අදාල විදුහලේ විදුහල්පතිවරයාත්, කලාප හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා (සෞන්දර්ය), අතර පමණි. තම පාසලේ වෙනත් පාර්ශවයන් එම කටයුතු වලට මැදිහත් කර නොගැනීමේ වගකීම් ද අදාල පාසලේ විදුහල්පතිවරයා වෙත සෘජුවම පැවරේ.

06.05. කිසිදු හේතුවක් මත පාසලකට මෙම උපදෙස් පරිශීලනය කිරීමට නොහැකි වීම හෝ නොකිරීම නිදහසට කරුණක් නොවන අතර, ඉන් සිසුනට සිදුවිය හැකි හානි, නොසැලකිලිමත් බවේ හා වගකීම් විරහිත බවේ ප්‍රතිඵල ලෙස සලකා ඊට වගකිව යුතු පාර්ශවයන්ට අදාල විනයානුකූල පියවර ගනු ලැබේ.

06.06. තරගයට සහභාගීවන්නන්, පාර්ශවකරුවන්, සිසුන් මෙන්ම ගුරු භවතුන්, නිලධාරීන්, තරග විනිසුරුවන්ගේ මෙන්ම පාසල් සහ අධ්‍යාපන ආයතනයන් හි පෞරුෂයට, ප්‍රතිරූපයට සහ ගෞරවයට හානිදායක වන අගතියට පත්වන දේ සිදු කරමින් ප්‍රසිද්ධ කරනු ලබන හෝ ක්‍රියාකරනු ලබන අයට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබේ.

06.07. අදාල පාසලේ විදුහල්පති, ගුරු භවතුන් සහ තරග අංක සඳහා සහභාගී වන සිසුන්ට පමණක් තරග මධ්‍යස්ථානය වෙත ඇතුල්වීමට අවසර ඇත.

- මෙම තරගයට අදාල තරග ශීර්ෂ, සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සනින් යුතුව මෙම චක්‍රලේඛයට අමුණා ඉදිරිපත් කරනු ලැබේ.

මෙම තරගය සඳහා ඉදිරිපත් වන සියලුම තරගකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් තරගයේ සෑම අවස්ථාවකම තරග චක්‍රලේඛයේ සඳහන් සියලුම නීති රීති පිළි පැදීමටත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත් එකඟ විය යුතු ය. සමස්ත ලංකා මට්ටමෙහි අවසාන තරගයට ඉදිරිපත්වන පාසල් සඳහා ලබා දෙන තරග කාලසටහන් ගොනුවෙහි අමුණා ඇති ප්‍රකාශය හොඳින් කියවා තේරුම් ගෙන විදුහල්පති විසින් අදාල ස්ථානයෙහි අත්සන් යොදා තරගයට ඉදිරිපත් විය යුතු ය. මෙම තරග චක්‍රලේඛයෙහි දක්වා ඇති වගන්ති හා සීමාවන් එකකට හෝ කිහිපයකට පටහැනිව කටයුතු කොට ඇති බව අනාවරණය වුවහොත් තරගයේ කුමන අවස්ථාවක වුව ද ප්‍රතිඵල ලේඛන වලින් එම විදුහල ඉවත් කිරීම, විනයානුකූල පියවර ගැනීම ඇතුළු අදාල වෙනත් තීරණ ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය සතුවේ.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

## තරග ශීර්ෂ

**සිසුන් 301 ත් 1000 අතර පාසල් සඳහා පමණි. (301 සහ 1000 ඇතුලත්ව)**

# A කාණ්ඩය

**06, 07, 08, 09 ශ්‍රේණි සඳහා සමූහ තරග**

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 01 | ගැහැණු | සමූහ | උඩරට | උකුසා වන්නම |
| තරග අංකය | 02 | පිරිමි | සමූහ | උඩරට | තුරඟා වන්නම |
| තරග අංකය | 03 | මිශ්‍ර | සමූහ | උඩරට | නෛයඩි වන්නම |
| තරග අංකය | 04 | ගැහැණු | සමූහ | පහතරට | භාවාදි තාලය සින්ඳු වන්නම |
| තරග අංකය | 05 | පිරිමි | සමූහ | පහතරට | හනුමන්තා තාලය |
| තරග අංකය | 06 | මිශ්‍ර | සමූහ | පහතරට | අනුරාග දණ්ඩ තාලය |
| තරග අංකය | 07 | ගැහැණු | සමූහ | සබරගමු | ආනන්ද වන්නම |
| තරග අංකය | 08 | පිරිමි | සමූහ | සබරගමු | තැඹිලි පාලිය |
| තරග අංකය | 09 | මිශ්‍ර | සමූහ | සබරගමු | ගමන් මාත්‍රය |
| තරග අංකය | 10 | ගැහැණු | සමූහ | ගැමි නැටුම් නිර්මාණ | කුළු නැටුම (කුල්ල භාවිතා කරමින් කරන ක්‍රියාකාරකම්) |
| තරග අංකය | 11 | පිරිමි | සමූහ | නිර්මාණ | පතුරු නැටුම |
| තරග අංකය | 12 | මිශ්‍ර | සමූහ | නිර්මාණ | ගොයම් නැටුම (පැල සිටුවීම සිට අස්වනු නෙළා ගෙට ගැනීම දක්වා |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 13 | ගැහැණු | ඒකල | උඩරට | සූරපති වන්නම |
| තරග අංකය | 14 | පිරිමි | ඒකල | උඩරට | මුසලඩි වන්නම |
| තරග අංකය | 15 | ගැහැණු | ඒකල | පහතරට | සරල කවි තාල (මාත්‍ර 2+2,3+3,3+4) |
| තරග අංකය | 16 | පිරිමි | ඒකල | පහතරට | සරල කවි තාල (මාත්‍ර 2+2,3+3,3+4) |
| තරග අංකය | 17 | ගැහැණු | ඒකල | සබරගමු | තිසරා වන්නම |
| තරග අංකය | 18 | පිරිමි | ඒකල | සබරගමු | යක් පද මාත්‍රය |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 19 | ගැහැණු | ඒකල | උඩරට වාදනය | තනි තිතෙහි සහ දෙතිතේ එක් තාල රූපයක් ඇසුරින් මුලික පද සහ අලංකාර පද සහිතව වාදනයක් (ගායනා භාවිතා කළ නොහැක) |
| තරග අංකය | 20 | පිරිමි | ඒකල | උඩරට වාදනය | තනි තිතෙහි සහ දෙතිතේ එක් තාල රූපයක් ඇසුරින් මුලික පද සහ අලංකාර පද සහිතව වාදනයක් (ගායනා භාවිතා කළ නොහැක) |
| තරග අංකය | 21 | ගැහැණු | ඒකල | පහතරට වාදනය | තනි තිතෙහි සහ දෙතිතේ එක් තාල රූපයක් ඇසුරින් මුලික පද සහ අලංකාර පද සහිතව වාදනයක් (ගායනා භාවිතා කල නොහැක) |
| තරග අංකය | 22 | පිරිමි | ඒකල | පහතරට වාදනය | තනි තිතෙහි සහ දෙතිතේ එක් තාල රූපයක් ඇසුරින් මුලික පද සහ අලංකාර පද සහිතව වාදනයක් (ගායනා භාවිතා කළ නොහැක) |
| තරග අංකය | 23 | ගැහැණු | ඒකල | සබරගමු වාදනය | තනි තිතෙහි සහ දෙතිතේ එක් තාල රූපයක් ඇසුරින් මුලික පද සහ අලංකාර පද සහිතව වාදනයක් (ගායනා භාවිතා කළ නොහැක) |
| තරග අංකය | 24 | පිරිමි | ඒකල | සබරගමු වාදනය | තනි තිතෙහි සහ දෙතිතේ එක් තාල රූපයක් ඇසුරින් මුලික පද සහ අලංකාර පද සහිතව වාදනයක් (ගායනා භාවිතා කළ නොහැක) |

## B කාණ්ඩය

**10, 11, 12, 13 ශ්‍රේණි සඳහා**

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 25 | ගැහැණු | සමූහ | උඩරට | ගජගා වන්නම |
| තරග අංකය | 26 | පිරිමි | සමූහ | උඩරට | ගාහක වන්නම |
| තරග අංකය | 27 | මිශ්‍ර | සමූහ | උඩරට | අසදෘෂ වන්නම |
| තරග අංකය | 28 | ගැහැණු | සමූහ | පහතරට | සුරහා වල්ලිය |
| තරග අංකය | 29 | පිරිමි | සමූහ | පහතරට | මාත්‍රාපහ ගායනා රහිතව (එක්තාලය ,දෙතාලය, තුන් තාලය, සියපදය, නඩන්දුව) |
| තරග අංකය | 30 | මිශ්‍ර | සමූහ | පහතරට | ශුද්ධ මාත්‍රය |
| තරග අංකය | 31 | ගැහැණු | සමූහ | සබරගමු | සින්දු මාත්‍රය |
| තරග අංකය | 32 | පිරිමි | සමූහ | සබරගමු | තාල නවයේ ග්‍රහ පංති වලින් කැමති තාල රූප හතරක් |
| තරග අංකය | 33 | මිශ්‍ර | සමූහ | සබරගමු | සමන් දෙවි මල් අස්න |
| තරග අංකය | 34 | ගැහැණු | සමූහ | නිර්මාණ | තේ කර්මාන්තය ඇසුරින් |
| තරග අංකය | 35 | පිරිමි | සමූහ | නිර්මාණ | මැණික් පතල් කර්මාන්තය ඇසුරින් |
| තරග අංකය | 36 | මිශ්‍ර | සමූහ | නිර්මාණ | ධීවර කර්මාන්තය |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 37 | ගැහැණු | ඒකල | උඩරට | අස්නය (2+2+4,4+4,3+3,2+2, තාල රූප ඇසුරින්) |
| තරග අංකය | 38 | පිරිමි | ඒකල | උඩරට | යක්තුන් පදය |
| තරග අංකය | 39 | ගැහැණු | ඒකල | පහතරට | පත්තිනි පද, (අවම වශයෙන් පද තුනක් තිබිය යුතුය,කරඩු පද භාවිතා කළ නොහැක.) |
| තරග අංකය | 40 | පිරිමි | ඒකල | පහතරට | රට යකුමෙහි නානුමුරය දෙබස් රහිතව) |
| තරග අංකය | 41 | ගැහැණු | ඒකල | සබරගමු | මුල් මාත්‍රය |
| තරග අංකය | 42 | පිරිමි | ඒකල | සබරගමු | කුරුම්බර පද |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 43 | ගැහැණු | ඒකල | උඩරට වාදනය | මඟුල් බෙරය (වට්ටම් 1,2,ඇසුරින්) |
| තරග අංකය | 44 | පිරිමි | ඒකල | උඩරට වාදනය | මල් හත් පද වාදනය (අවම වශයෙන් තාල රූප තුනක්වත් තිබිය යුතුය. |
| තරග අංකය | 45 | ගැහැණු | ඒකල | පහතරට වාදනය | පත්තිනි සවිදම ගායනා සහිතව |
| තරග අංකය | 46 | පිරිමි | ඒකල | පහතරට වාදනය | ගණපති සවිදම ගායනා සහිතව |
| තරග අංකය | 47 | ගැහැණු | ඒකල | සබරගමු වාදනය | ගායනා සහිත වාදනයක් (තාලරූප දෙකක් කලාසම අඩව්ව සහිතව) |
| තරග අංකය | 48 | පිරිමි | ඒකල | සබරගමු වාදනය | මංගල දවුල් වාදනය 1,2, වට්ටම් ඇසුරින් (කඩිප්පු භාවිතා කළ යුතුය.) |

**10,11,12.13 ශ්‍රේණි සඳහා ඒකල සහ යුගල මිනිස් චරිත නිරූපණ**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 49 | ගැහැණු | ඒකල | විහාර මහා දේවිය |
| තරග අංකය | 50 | පිරිමි | ඒකල | රාවණ රජු |
| තරග අංකය | 51 | මිශ්‍ර | යුගල | කුස පබාවතී |

- විශේෂයෙන් සකස් කරන ලද පසුතල සහ රංග භාණ්ඩ භාවිතා කළ නොහැකි ය. රංග වස්ත්‍රාභරණ භාවිතා කළහැකි ය.

**12,13 ශ්‍රේණි සඳහා තෝරාගත් පටිගත කරන ලද සංගීත ඛණ්ඩයක් යොදාගනිමින් සත්ත්ව චරිත නිරූපණ**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 52 | ගැහැණු | ඒකල | උකුස්සා |
| තරග අංකය | 53 | පිරිමි | ඒකල | ඇතා |

- විශේෂයෙන් සකස් කරන ලද පසුතල සහ රංග භාණ්ඩ භාවිතා කළ නොහැකි ය. රංග වස්ත්‍රාභරණ භාවිතා කළ හැකි ය.

- **ඉහත තරග අංකය සඳහා පටිගත කරන ලද සංගීතය යොදාගත යුතු ය. අවශ්‍ය තාක්ෂණික උපකරණ සහභාගීවන්නන් විසින්ම සපයාගත යුතු ය. රංග භාණ්ඩ භාවිතා නොකළ යුතු අතර නර්තන මාධ්‍ය භාවිත කළ යුතු ය.**

**<u>සිසුන් 1001 ට වැඩි පාසල් සඳහා පමණි. (1001 ඇතුලත්ව)</u>**

## A කාණ්ඩය

### 06, 07, 08, 09 ශ්‍රේණි සඳහා සමූහ තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 54 | ගැහැණු | සමූහ | උඩරට | උකුසා වන්නම |
| තරග අංකය | 55 | පිරිමි | සමූහ | උඩරට | තුරඟා වන්නම |
| තරග අංකය | 56 | මිශ්‍ර | සමූහ | උඩරට | නෛයඩි වන්නම |
| තරග අංකය | 57 | ගැහැණු | සමූහ | පහතරට | නාති ලිංචි තාලය |
| තරග අංකය | 58 | පිරිමි | සමූහ | පහතරට | ශුද්ධ තාලය |
| තරග අංකය | 59 | මිශ්‍ර | සමූහ | පහතරට | ඊශ්වර කුණ්ඩ තාලය |
| තරග අංකය | 60 | ගැහැණු | සමූහ | සබරගමු | කදම්භ පක්ෂී වන්නම |
| තරග අංකය | 61 | පිරිමි | සමූහ | සබරගමු | කිඳුරු වන්නම |
| තරග අංකය | 62 | මිශ්‍ර | සමූහ | සබරගමු | නාග ගජගා වන්නම |
| තරග අංකය | 63 | ගැහැණු | සමූහ | ගැමි නැටුම් | කුළු නැටුම (කුල්ල භාවිතා කරමින් කරන ක්‍රියාකාරකම්) |
| තරග අංකය | 64 | පිරිමි | සමූහ | ගැමි නැටුම් | පතුරු නැටුම |
| තරග අංකය | 65 | මිශ්‍ර | සමූහ | ගැමි නැටුම් | ගොයම් නැටුම (පැල සිටුවීම සිට අස්වනු නෙළා ගෙට ගැනීම දක්වා |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 66 | ගැහැණු | ඒකල | උඩරට | සුරපති වන්නම |
| තරග අංකය | 67 | පිරිමි | ඒකල | උඩරට | මුසලඩි වන්නම |
| තරග අංකය | 68 | ගැහැණු | ඒකල | පහතරට | පත්තිනි මල් අස්න |
| තරග අංකය | 69 | පිරිමි | ඒකල | පහතරට | නාථ මල් අස්න |
| තරග අංකය | 70 | ගැහැණු | ඒකල | සබරගමු | ගමන් මාත්‍රය |
| තරග අංකය | 71 | පිරිමි | ඒකල | සබරගමු | යක් පද මාත්‍රය |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 72 | ගැහැණු | ඒකල | උඩරට වාදනය | තනි තිතෙහි සහ දෙතිතේ එක් තාල රූපයක් ඇසුරින් මූලික පද සහ අලංකාර පද සහිතව වාදනයක් (ගායනා භාවිතා කළ නොහැක) |
| තරග අංකය | 73 | පිරිමි | ඒකල | උඩරට වාදනය | තනි තිතෙහි සහ දෙතිතේ එක් තාල රූපයක් ඇසුරින් මූලික පද සහ අලංකාර පද සහිතව වාදනයක් (ගායනා භාවිතා කළ නොහැක) |
| තරග අංකය | 74 | ගැහැණු | ඒකල | පහතරට වාදනය | තනි තිතෙහි සහ දෙතිතේ එක් තාල රූපයක් ඇසුරින් මූලික පද සහ අලංකාර පද සහිතව වාදනයක් (ගායනා භාවිතා කළ නොහැක) |
| තරග අංකය | 75 | පිරිමි | ඒකල | පහතරට වාදනය | තනි තිතෙහි සහ දෙතිතේ එක් තාල රූපයක් ඇසුරින් මූලික පද සහ අලංකාර පද සහිතව වාදනයක් (ගායනා භාවිතා කළ නොහැක) |
| තරග අංකය | 76 | ගැහැණු | ඒකල | සබරගමු වාදනය | තනි තිතෙහි සහ දෙතිතේ එක් තාල රූපයක් ඇසුරින් මූලික පද සහ අලංකාර පද සහිතව වාදනයක් (ගායනා භාවිතා කළ නොහැක) |
| තරග අංකය | 77 | පිරිමි | ඒකල | සබරගමු වාදනය | තනි තිතෙහි සහ දෙතිතේ එක් තාල රූපයක් ඇසුරින් මූලික පද සහ අලංකාර පද සහිතව වාදනයක් (ගායනා භාවිතා කළ නොහැක) |

# B කාණ්ඩය

**10, 11, 12, 13 ශ්‍රේණි සඳහා**

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 78 | ගැහැණු | සමූහ | උඩරට | ගජගා වන්නම |
| තරග අංකය | 79 | පිරිමි | සමූහ | උඩරට | ගාහක වන්නම |
| තරග අංකය | 80 | මිශ්‍ර | සමූහ | උඩරට | අසදෘෂ වන්නම |
| තරග අංකය | 81 | ගැහැණු | සමූහ | පහතරට | සූරඹා වල්ලිය |
| තරග අංකය | 82 | පිරිමි | සමූහ | පහතරට | තෙල්මේ |
| තරග අංකය | 83 | මිශ්‍ර | සමූහ | පහතරට | ශුද්ධ මාත්‍රය |
| තරග අංකය | 84 | ගැහැණු | සමූහ | සබරගමු | සළඹ ශාන්තිය |
| තරග අංකය | 85 | පිරිමි | සමූහ | සබරගමු | මඩු හමාරය |
| තරග අංකය | 86 | මිශ්‍ර | සමූහ | සබරගමු | දේව කෝල් පාඩුව |
| තරග අංකය | 87 | ගැහැණු | සමූහ | නිර්මාණ | තේ කර්මාන්තය ඇසුරින් |
| තරග අංකය | 88 | පිරිමි | සමූහ | නිර්මාණ | මැණික් පතල් කර්මාන්තය ඇසුරින් |
| තරග අංකය | 89 | මිශ්‍ර | සමූහ | නිර්මාණ | ධීවර කර්මාන්තය ඇසුරින් |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 90 | ගැහැණු | ඒකල | උඩරට | අස්නය (2+2+4,4+4,3+3,2+2, තාල රූප ඇසුරින්) |
| තරග අංකය | 91 | පිරිමි | ඒකල | උඩරට | යක්තුන් පදය |
| තරග අංකය | 92 | ගැහැණු | ඒකල | පහතරට | පත්තිනි පද, (අවම වශයෙන් පද තුනක් තිබිය යුතුය,කරඩු පද භාවිතා කළ නොහැක.) |
| තරග අංකය | 93 | පිරිමි | ඒකල | පහතරට | රට යකුමෙහි නානුමුරය දෙබස් රහිතව) |
| තරග අංකය | 94 | ගැහැණු | ඒකල | සබරගමු | සළු පාලිය |
| තරග අංකය | 95 | පිරිමි | ඒකල | සබරගමු | කලස් පාලිය |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 96 | ගැහැණු | ඒකල | උඩරට වාදනය | මඟුල් බෙරය (වට්ටම් 1,2 ඇසුරින්) |
| තරග අංකය | 97 | පිරිමි | ඒකල | උඩරට වාදනය | මල් හත් පද වාදනය (අවම වශයෙන් තාල රූප තුනක්වත් තිබිය යුතුය. |
| තරග අංකය | 98 | ගැහැණු | ඒකල | පහතරට වාදනය | පත්තිනි සවිදම ගායනා සහිතව |
| තරග අංකය | 99 | පිරිමි | ඒකල | පහතරට වාදනය | ගණපති සවිදම ගායනා සහිතව |
| තරග අංකය | 100 | ගැහැණු | ඒකල | සබරගමු වාදනය | ගායනා සහිත වාදනයක් (තාලරූප දෙකක් කලාසම අඩව්ව සහිතව) |
| තරග අංකය | 101 | පිරිමි | ඒකල | සබරගමු වාදනය | මංගල දවුල් වාදනය 1,2 වට්ටම් ඇසුරින් (කඩිප්පු භාවිතා කළ යුතුය.) |

**10,11,12.13 ශ්‍රේණි සඳහා ඒකල සහ යුගල මිනිස් චරිත නිරූපණ**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 102 | ගැහැණු | ඒකල | විහාර මහා දේවිය |
| තරග අංකය | 103 | පිරිමි | ඒකල | රාවණ රජු |
| තරග අංකය | 104 | මිශ්‍ර | යුගල | කුස පබාවතී |

- විශේෂයෙන් සකස් කරන ලද පසුතල සහ රංග භාණ්ඩ භාවිතා කළ නොහැකි ය. රංග වස්ත්‍රාභරණ භාවිතා කළ හැකි ය.

**12,13 ශ්‍රේණි සඳහා තෝරාගත් පටි ගත කරන ලද සංගීත ඛණ්ඩයක් යොදාගනිමින් සත්ත්ව චරිත නිරූපණ**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 105 | ගැහැණු | ඒකල | උකුස්සා |
| තරග අංකය | 106 | පිරිමි | ඒකල | ඇතා |

- විශේෂයෙන් සකස් කරන ලද පසුතල සහ රංග භාණ්ඩ භාවිතා කළ නොහැකි ය. රංග වස්ත්‍රාභරණ භාවිතා කළ හැකි ය.

- **ඉහත තරග අංකය සඳහා පටිගත කරන ලද සංගීතය යොදාගත යුතු ය. අවශ්‍ය තාක්ෂණික උපකරණ සහභාගීවන්නන් විසින්ම සපයාගත යුතු ය. රංග භාණ්ඩ භාවිතා නොකළ යුතු අතර නර්තන මාධ්‍ය භාවිත කළ යුතු ය.**

# C කාණ්ඩය

(12 සහ 13 ශ්‍රේණි පමණක් පවතින සෞන්දර්ය පාසල් මේ සඳහා ඉල්ලුම් කළ නොහැකි ය. එම පාසල් සිසුන් 301- 1000 අතර පාසල් යටතේ තරග කළ යුතුය.)

**10 - 13 ශ්‍රේණි සඳහා විවෘත සමූහ තරග**

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 107 | ගැහැණු | සමූහ | උඩරට | මයුරා වන්නම |
| තරග අංකය | 108 | පිරිමි | සමූහ | උඩරට | කොහොඹා දෙවි ඉරුගල් බණ්ඩාර කෝල් මුර ගායනා ඇසුරින් නර්තනයක් (තාල රූප දෙකක්වත් තිබිය යුතු ය.) |
| තරග අංකය | 109 | මිශ්‍ර | සමූහ | උඩරට | පලවැල දානය (තාල රූප තුනක්වත් තිබිය යුතු ය.) |
| තරග අංකය | 110 | ගැහැණු | සමූහ | පහතරට | දළුමුර පදය |
| තරග අංකය | 111 | පිරිමි | සමූහ | පහතරට | වඩිග පටුන දෙබස් රහිත |
| තරග අංකය | 112 | මිශ්‍ර | සමූහ | පහතරට | කොතල පදය |
| තරග අංකය | 113 | ගැහැණු | සමූහ | සබරගමු | කොවුලා වන්නම |
| තරග අංකය | 114 | පිරිමි | සමූහ | සබරගමු | මණ්ඩූක වන්නම |
| තරග අංකය | 115 | මිශ්‍ර | සමූහ | සබරගමු | අනිලා වන්නම |
| තරග අංකය | 116 | ගැහැණු | සමූහ | ගැමි නැටුම | පන් නෙළීම සිට පැදුරු විවීම දක්වා |
| තරග අංකය | 117 | පිරිමි | සමූහ | ගැමි නැටුම | තාලම් |
| තරග අංකය | 118 | මිශ්‍ර | සමූහ | ගැමි නැටුම | ලී කෙළි (මල්ලිය සහිත) |

# D කාණ්ඩය

ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසල් වෙන් වෙන්ව නොව විවෘත එක් කාණ්ඩයක් ලෙස සලකා තරග පැවැත්වේ.
(සියලුම රජයේ පාසල්/ පිරිවෙන් විද්‍යායතන/ රජයේ අනුමත පෞද්ගලික පාසල් වලට පමණක් ඉදිරිපත් විය හැකි ය)

**10,11,12,13 ශ්‍රේණි සඳහා ගොප් කොල ඇසුරින් සැරසිලි හා කැටයම් නිර්මාණය.**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 119 | ගැහැණු/පිරිමි | ඒකල | ගොක් ගෙඩි නිර්මාණය |

- කාලය තරගය පවත්වන දිනයේ දී දැනුම් දෙනු ලැබේ.
- ගොප් අත්තක් සහ කෙසෙල් බඩයක් සපයා ගත යුතු ය.
- අවශ්‍ය අනෙකුත් දේ සපයා ගත යුතු ය.
- 2022 වර්ෂයේ නර්තන චක්‍රලේඛයට අනුව ඉහත අංගයට ඉදිරිපත් වී ප්‍රථම ස්ථානය ලබාගත් සිසුන්ට මේ සඳහා අවස්ථාව නොලැබේ.

**10,11,12,13 ශ්‍රේණි සඳහා තරග**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 120 | ගැහැණු/පිරිමි | ඒකල | තම්මැට්ටම් කඩිප්පුව සැකසීම |
| තරග අංකය | 121 | ගැහැණු/පිරිමි | ඒකල | දවුල් කඩිප්පුවක් නිර්මාණය කිරීම |
| තරග අංකය | 122 | පිරිමි | ඒකල | උඩරට බෙරයක දකුණු ඇස දැමීම |
| තරග අංකය | 123 | ගැහැණු | ඒකල | ගැහැණු නිර්මාණ නර්තනයක් සඳහා ශීර්ෂාභරණ කට්ටලයක් නිර්මාණය කිරීම (හිසට සහ කණට)<br>මාධ්‍ය සඳහා රබර් බෝඩ් පමණක් භාවිතා කළ යුතු ය. |
| තරග අංකය | 123-A | පොදු | සමූහ | ජස කෝලම - ජස ලෙන්චිනා කෝලමට අදාල චරිත 5 ක් යොදා ගනිමින් සාම්ප්‍රධායික ලක්ෂණ ඇතුලත්ව විනාඩි 6 කට සීමා වූ ඉදිරිපත් කිරීමක් |

- 2022 වර්ෂයේ නර්තන චක්‍රලේඛයේ තරග අංක 92 හි සඳහන් තම්මැට්ටම් කඩිප්පු නිර්මාණය ප්‍රථම ජයග්‍රහණ ස්ථාන ලබාගත් ශිෂ්‍යයන්ට එම අංගයෙන්ම තරගයට සහභාගී විය නොහැකි ය.
- කාලය තරගය පවත්වන දිනයේ දී දැනුම් දෙනු ලැබේ.
- අවශ්‍ය අමුද්‍රව්‍ය සපයාගත යුතු අතර කලින් සකස් කළ අමුද්‍රව්‍ය භාවිත නොකළ යුතු ය.

**06 - 13 ශ්‍රේණි සඳහා**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 124 | පිරිමි/<br>ගැහැණු | ඒකල | බෙර වාදනය සමග ගායනා ඉදිරිපත් කිරීම.<br>අවම වශයන් තාල රූප 5 ක්වත් තිබිය යුතු ය. |

**10,11,12,13 ශ්‍රේණි සඳහා මංගල පෝරු සැරසීම සහ චාරිත්‍ර විධි ඉදිරිපත් කිරීම.**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 125 | පිරිමි | ඒකල | මංගල පෝරු සැරසිලි සහ චාරිත්‍ර. |

- 2022 වර්ෂයේ දී ප්‍රථම ස්ථානය ලබාගත් අයට ඉදිරිපත් විය නොහැකි ය.
- සජීවී ඉදිරිපත් කිරීමකි.
- තරගය පවත්වන දිනයේ දී දැනුම් දෙනු ලැබේ.
- ගැලපෙන ඇඳුමින් සැරසී පෝරු සැරසිලි සකස් කළ යුතු ය.
- විනිශ්චය මණ්ඩලය වෙත ගායනා ඉදිරිපත් කළ යුතු ය.
- සැරසිලි සඳහා අවශ්‍ය සියලුම ද්‍රව්‍ය සපයා ගත යුතු ය.

**10,11,12,13 ශ්‍රේණි සඳහා ලී වෙස් මුහුණු නිර්මාණය.**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 126 | ගැහැණු/පිරිමි | ඒකල | ලී වෙස් මුහුණු නිර්මාණය |

- **2022 වර්ෂයේදී මෙම තරග අංගයෙන් ඉදිරිපත්ව ප්‍රථම ස්ථානය ලබා ගත් ජයග්‍රාහකයින්ට ඉදිරිපත් විය නොහැක.**
- **සජීවීව නිර්මාණය ඉදිරිපත් කළ යුතු ය.**
- **කාලය පැය 06 කි.**
- **අවශ්‍ය සියලුම ද්‍රව්‍ය සපයා ගත යුතු ය.**
- **කෝලම් නාටක වලට අදාල මිනිස් චරිතයක් විය යුතු ය.**
- **ලී කොටයේ සිට වර්ණ ගන්වා නිම වනතුරු තනිව නිර්මාණය සිදු කල යුතු ය.**

## E කාණ්ඩය

**ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් සඳහා පමණි.**

**06 -13 ශ්‍රේණි සඳහා**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 127 | ගැහැණු | සමූහ | උඩරට - කොහොඹා හැල්ල |
| තරග අංකය | 128 | පිරිමි | සමූහ | පහතරට - දෙවොල් පද |
| තරග අංකය | 129 | මිශ්‍ර | සමූහ | සබරගමු - සිංදු මාත්‍රය |

## <u>විශේෂ තරග</u>

**10, 11, 12, 13 ශ්‍රේණි සඳහා භරත නාට්‍යම් සහ කථක් නර්තන අංග**

- රජයේ පාසල්/ පිරිවෙන් විද්‍යායතන/ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට ඉදිරිපත් විය හැකි ය.
- මෙම තරගය සඳහා ඉහත සඳහන් තරග වලට අමතරව විශේෂ තරගයක් ලෙස පවත්වනු ලැබේ.
- 1.1.3, 1.1.4 සහ 1.1.5 සඳහන් සහභාගීවිය හැකි තරග අංග සංඛ්‍යාවට අමතරව <u>එක් පාසලකට</u> (තරග අක **130 -143** යටතේ) භරත නාට්‍යම් සහ කථක් නර්තන තරග අංග යටතේ අදාල ඕනෑම තරග අංග 02 කට පමණක් සහභාගී විය හැකි ය.
- මෙම තරගය සඳහා පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව අනුව වෙන් වෙන් වශයෙන් තරග නොපැවැත්වේ.
- **2022** වර්ෂයේ දී <u>භරත නාට්‍යම් සහ කථක් නර්තන තරගය</u> - ඒකල තරග වලින් ප්‍රථම ස්ථානය ජයග්‍රහණය කරන ලද පාසල් එම තරග අංගයෙන්ම ඉදිරිපත් විය නොහැකි ය.
- අවසන් තරග පැවැත්වීම සඳහා වෙනම දිනයක් දන්වනු ලැබේ.
- දමිළ මාධ්‍ය පාසල් සඳහා සහභාගී විය නොහැකි ය.

**<u>භරත නාට්‍යම් තරග</u>**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 130 | ගැහැණු | සමූහ | ජතීස්වරම් (වසන්ත) |
| තරග අංකය | 131 | පිරිමි | සමූහ | තිල්ලානා (හින්දෝලම්) |
| තරග අංකය | 132 | මිශ්‍ර | සමූහ | අලාරිප්පු (තිශ්‍ර) |

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 133 | ගැහැණු | ඒකල | ශබ්දම් (අයර්ශේරියේ) |
| තරග අංකය | 134 | පිරිමි | සමූහ | පදම් |

**<u>කථක් නර්තන තරග</u>**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 135 | ගැහැණු | සමූහ | ගසල් |
| තරග අංකය | 136 | පිරිමි | සමූහ | තරාණා |
| තරග අංකය | 137 | මිශ්‍ර | සමූහ | ඨුම්රි |
| තරග අංකය | 138 | පොදු | සමූහ | භජන් (ගැහැණු, පිරිමි වශයෙන් වර්ග නොකෙරේ.) |

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 139 | ගැහැණු | ඒකල | ශ්ලෝක, ආමද්, ඨාය් හා චක්‍රධාර් පරණ්, පරණ් ජුඩි ආමද්, ටුක්ඩා (චක්‍රධාර් පරමේලු), ලඩි, පල්ටා, තිහායි<br>ත්‍රිතාලයට අනුකූල වන පරිදි ශාස්ත්‍රීය නර්තනයක් |
| තරග අංකය | 140 | පිරිමි | ඒකල | ත්‍රී තාලයට අනුව විවධ කවිත්ත සහ ලඩි, පල්ටා, තිහායි යනාදී අංග අන්තර්ගතවන පරිදි ශාස්ත්‍රීය නර්තනයක් |

**මෙම තරගය සඳහා ඉදිරිපත් වන සියලුම තරගකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් තරගයේ සෑම අවස්ථාවකම තරග චක්‍රලේඛයේ සඳහන් සියලු නීති රීති පිළිපැදීමටත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත් එකඟ විය යුතු ය. සමස්ත ලංකා මට්ටමෙහි අවසාන තරගයට ඉදිරිපත් වන පාසල් සඳහා ලබා දෙන තරග කාල සටහන් ගොනුවෙහි අමුණා ඇති ප්‍රකාශය හොඳින් කියවා තේරුම් ගෙන විදුහල්පති විසින් අදාල ස්ථානයෙහි අත්සන් යොදා තරගයට ඉදිරිපත් විය යුතු ය.**

ආචාර්ය නිශාද් හඳුන්පතිරණ
අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)
අධ්‍යාපන ලේකම් වෙනුවට